AAT SRI LANKA

2020 ජූලි විභාග සඳහා අයදුම් කිරීමට
2015 ජූලි සිට 2020 ජනවාරි අතර කාලය තුළ පවත්වන ලද විභාගවලට පෙනී සිටි
ශිෂ්‍යයන්ට අදාළ වන

# අන්තර්කාලීන විධිවිධාන

(2020 වසරේදී අලුතින් ලියාපදිංචි වූ සිසුන්ට මෙම අන්තර්කාලීන විවිධාන අදාළ නොවේ.)

| S/N | ශිෂ්‍ය ප්‍රභේදය - 2015 විෂය නිර්දේශය | අන්තර්කාලීන විධිවිධාන - 2020 විෂය නිර්දේශය |
|---|---|---|
| | **AA1 මට්ටම** | **I වන අදියර** |
| 01. | AA1 මට්ටමේ සියලුම විෂයන් සමත් වූ හෝ නිදහස් වීම් ලබාගත් සිසුන් | මෙම සිසුන් I වන අදියරේ සියලුම විෂයන්ගෙන් නිදහස් කරනු ලැබේ. |
| 02. | AA1 මට්ටමේ විෂයන් වලට පෙනී සිට සමහර විෂයයන් **අසමත්** වූ සිසුන්,<br>• AA11 - මූල්‍ය ගිණුම්කරණ මූලිකයන් →<br>• AA12 - ව්‍යාපාර සඳහා ප්‍රමාණාත්මක ක්‍රම →<br>• AA13 - ව්‍යාපාර හා ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව →<br>• AA15 - ව්‍යාපාර මෙහෙයුම් සහ කළමනාකරණය → | මෙම සිසුන් I වන අදියරේ අඩංගු පහත සඳහන් අනුරූපී විෂයයන්වලට පෙනී සිට සමත් විය යුතුය.<br>• 101 - මූල්‍ය ගිණුම්කරණය (FAC)<br>• 102 - ව්‍යාපාරික ගණිතය හා සංඛ්‍යානය (BMS)<br>• 103 - ආර්ථික විද්‍යාව (ECN)<br>• 104 - ව්‍යාපාරික පරිසරය (BEN) |
| | **AA2 මට්ටම** | **II වන අදියර** |
| 03. | AA2 මට්ටමේ සියලුම විෂයන් සමත් වූ හෝ නිදහස්වීම් ලබාගත් සිසුන් | මෙම සිසුන් II වන අදියරේ සියලුම විෂයයන්ගෙන් නිදහස් කරනු ලැබේ. ඒ අනුව මෙම සිසුන් II වන අදියරට එකතු වූ 202 - ඩිජිටල් පරිසරයේ තොරතුරු පද්ධති (ISD) විෂයට **ඉල්ලුම් කළ යුතු නැත.** |
| 04. | AA2 මට්ටමේ සමහර විෂයයන් අසමත් වූ සිසුන් (මෙම සිසුන් කුසලතා කැප්ස්ටෝනයේ තිබූ SS2 - තොරතුරු තාක්ෂණ කුසලතා (ITS) යන විෂය ද අසමත් වී ඇත්නම්).<br>• AA21 - උසස් මූල්‍ය ගිණුම්කරණය ]<br>• AA22 - පිරිවැය ගිණුම්කරණය සහ වාර්තාකරණය ] →<br>• AA25 - ව්‍යාපාර නීතිය සහ ආචාර ධර්ම →<br>• AA26 - ව්‍යාපාර කළමනාකරණය සහ උපාය මාර්ග →<br>• SS2 - තොරතුරු තාක්ෂණ කුසලතා → | මෙම සිසුන් II වන අදියරේ අඩංගු පහත සඳහන් අනුරූපී විෂයන්වලට පෙනී සිට සමත් විය යුතුය.<br>• 201 - උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය (AFC)<br>• 203 - ව්‍යාපාර නීතිය (BLA)<br>• 204 - ව්‍යාපාර කළමනාකරණය (BMA)<br>• 202 - ඩිජිටල් පරිසරයේ තොරතුරු පද්ධති (ISD) |
| 05. | AA2 මට්ටමේ සියලුම විෂයන් සමග SS2-තොරතුරු තාක්ෂණ කුසලතා (ITS) යන විෂයට ද පෙනී සිට, **පෙනී සිටි** අනෙකුත් සියලුම විෂයයන් සමත් වී AA22 - පිරිවැය ගිණුම්කරණය සහ වාර්තාකරණය (CAR) **විෂය පමණක් අසමත් සිසුන්** | මෙම සිසුන් II වන අදියරේ සියලුම විෂයන්ගෙන් නිදහස් කරනු ලැබේ. (කලින් තිබූ AA21 - උසස් මූල්‍ය ගිණුම්කරණය සමත්වීම සහ AA22 - පිරිවැය ගිණුම්කරණය සහ වාර්තාකරණය විෂයට **පෙනී සිටීම** මත 201 - උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය විෂය නිදහස් කර ඇත) |
| 06. | AA2 මට්ටමේ AA22 - පිරිවැය ගිණුම්කරණය සහ වාර්තාකරණය (CAR) විෂයට **පෙනී නොසිට** AA21 - උසස් මූල්‍ය ගිණුම්කරණය විෂය **සමත්** සහ SS2-තොරතුරු තාක්ෂණ කුසලතා (ITS) විෂය **අසමත්** සිසුන් | මෙම සිසුන් 201 - උසස් මූල්‍ය ගිළුම්කරණය සහ පිරිවැයකරණය (AFC) විෂය සහ 202 - ඩිජිටල් පරිසරයේ තොරතුරු පද්ධති (ISD) විෂයට ඉල්ලුම්කර II වන අදියර සම්පූර්ණ කළ යුතුය.<br>(ඉහත 201 - උස් මූල්‍ය ගිණුම්කරණ සහ පිරිවැයකරණය විෂයට ඉල්ලුම් කිරීමට සිදුවන්නේ පැරණි නිර්දේශයේ තිබූ AA22 -පිරිවැය ගිණුම්කරණය සහ වාර්තාකරණය විෂයට පෙනී නොසිටි නිසාය.) |
| 07. | AA2 මට්ටමේ සියලුම විෂයන්වලට පෙනී සිට AA22 - පිරිවැය ගිණුම්කරණය සහ වාර්තාකරණය විෂය පමණක් **අසමත්ව** අනෙකුත් විෂයන් සමත් වී ඇති අතර, SS2-තොරතුරු තාක්ෂණ කුසලතා (ITS) විෂය සම්පූර්ණ කර නොමැති සිසුන් | මෙම සිසුන් 202 - ඩිජිටල් පරිසරයේ තොරතුරු පද්ධති විෂයට ඉල්ලුම කර සමත් විය යුතු අතර, AA22 - CAR විෂයට පෙනී සිටි බැවින් 201-උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය විෂයෙන් නිදහස් කරනු ලැබේ. |
| | **AA3 මට්ටම** | **III වන අදියර** |
| 08. | AA3 මට්ටමේ සියලුම විෂයන් සමත් වූ හෝ නිදහස්වීම් ලබාගත් සිසුන් | මෙම සිසුන් III වන අදියරේ සියලුම විෂයන්ගෙන් නිදහස් කරනු ලැබේ. |
| 09. | AA3 මට්ටමේ විෂයන්වලට පෙනී සිට සමහර විෂයයන් අසමත් සිසුන්<br>• AA31 - මූල්‍ය ගිණුම්කරණය සහ වාර්තාකරණය →<br>• AA32 - කළමනාකරණ ගිණුම්කරණය සහ මූල්‍ය →<br>• AA34 - ක්‍රියාවලීන්, පාලනයන් සහ විගණනය →<br>• AA35 - සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය → | මෙම සිසුන් III වන අදියරේ අඩංගු පහත සඳහන් අනුරූපී විෂයන්වලට පෙනී සිට සමත්විය යුතුය.<br>• 301 - මූල්‍ය වාර්තාකරණය (FAR)<br>• 302 - කළමනාකරණ ගිණුම්කරණය සහ මූල්‍ය (MAF)<br>• 303 - මූල්‍ය පාලනයන් සහ විගණනය (FCA)<br>• 304 - සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය (CPT) |
| 10. | AA3 මට්ටමේ සියලුම විෂයන්වලට පෙනී සිට AA3 මට්ටම සමත් වී ඇති අතර, කුසලතා කැප්ස්ටෝනයේ තිබූ SS2 - තොරතුරු තාක්ෂණ කුසලතා (ITS) සහ සඵලදායී සන්නිවේදන කුසලතා (ECS) යන විෂයන් සමත් වී නොමැති සිසුන්. | මෙම සිසුන් III වන අදියරේ ඇති සියලුම විෂයන්ගෙන් නිදහස් වන අතර, 202 - ඩිජිටල් පරිසරයේ තොරතුරු පද්ධති යන විෂයෙන් ද නිදහස් කරනු ලැබේ. 310 - ව්‍යාපාරික සන්නිවේදනය (BC) විෂයට පමණක් ඉල්ලුම් කර සමත් විය යුතුය. |
| | **කුසලතා (හැකියා) කැප්ස්ටෝනය** | **කුසලතා ආධාරක විෂය** |
| 11. | SS1 - සඵලදායී සන්නිවේදන කුසලතා (ECS) විෂය **සමත් වූ** සිසුන් | මෙම සිසුන් 310 - ව්‍යාපාරික සන්නිවේදනය (BC) විෂයෙන් නිදහස් කරනු ලැබේ. |
| 12. | SS1 - සඵලදායී සන්නිවේදන කුසලතා (ECS) විෂය **අසමත් වූ** සිසුන් | මෙම සිසුන් 310-ව්‍යාපාරික සන්නිවේදනය (BC) විෂයට අයදුම් කළ යුතුය. |
| 13. | SS2 - තොරතුරු තාක්ෂණ කුසලතා (ITS) විෂය **සමත් වූ** සිසුන් | මෙම සිසුන් II වන අදියරේ ඇති 202 - ඩිජිටල් පරිසරයේ තොරතුරු පද්ධති (ISD) විෂයෙන් නිදහස් කරනු ලැබේ. |
| 14. | SS2 - තොරතුරු තාක්ෂණ කුසලතා (ITS) විෂය පමණක් අසමත් / පෙනී නොසිටි අතර සෑම මට්ටමකම සියලුම තාක්ෂණ විෂයයන් SS1 - ECS විෂය සමග සමත් / නිදහස්වීම් ලබාගත් සිසුන් | මෙම සිසුන් 202 - ඩිජිටල් පරිසරයේ තොරතුරු පද්ධති (ISD) විෂය සමග සියලුම අදියරයන්ගෙන් නිදහස් කරනු ලැබේ. |

**සැ.යු. :** අවසන් විභාගය සමතෙකු (Passed Fiilist) වීමට නම්, 310 - ව්‍යාපාරික සන්නිවේදනය (BC) විෂය **සමත්** විය යුතු වේ.

වැඩිදුර තොරතුරු සඳහා ඒඒටී විභාග අංශය අමතන්න. **ක්ෂණික ඇමතුම්** : 0114 - 377007 හෝ **දුරකථන අංක** : (011) 2 559 669, දිගුව : 506/509/510